Proud to be THE DUKE OF EDINBURGH'S INTERNATIONAL AWARD In Sri Lanka

# ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය

# හා

# ක්‍රියා පටිපාටිය

**ජාතික තරුණ සේවා සභාවේ යෞවන තිළිණ ප්‍රදාන අංශය**

## ජාතික තරුණ සේවා සභාවේ යෞවන තිළිණ ප්‍රදාන අංශය

1. **ප්‍රතිපත්ති හා නියාමනයේ /නියෝගයේ නම**

   ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය හා ක්‍රියා පටිපාටිය

2. **ප්‍රතිපත්ති හා නියාමනයේ අරමුණ**

   ළමයින් සමඟ කටයුතු කිරීමේදී අපහාස කිරීම්, තුවාල සිදු කිරීම්, තර්ජන, හිරිහැර කිරීම්, බාධාකිරීම් අපයෝජනය හෝ වෙනත් ශාරීරික හෝ මානසික අලාභ සිදුකිරීම් වලින් ළමයින්ගේ/දරුවන්ගේ, ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරිමේ වගකීම් පිළිබඳව ශ්‍රී ලංකාවේ ජාතික තරුණ සේවා සභාවේ යෞවන තිළිණ ප්‍රදාන අංශයේ කාර්ය මණ්ඩලය හා ස්වේච්ඡා සේවක සේවිකාවන් දැනුවත් කිරිම මෙම ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති හා නියෝගවල අරමුණ වේ.

3. **මෙම නියෝගවලට අනුමැතිය දීම**

   ජාතික තරුණ සේවා සභාවේ විධායක කමිටුව/ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම නියෝග/ නියාමයන් අනුමත කළ යුතුයි.

4. **මෙම නියෝග යාවත්කාල කිරීමේ වගකීම**

   ජාතික අධ්‍යක්ෂ/පාලන කළමණාකරු/අදාල අංශයේ නියෝජ්‍ය හෝ සහකාර අධ්‍යක්ෂ විසින් මෙය සිදු කළයුතුය.

5. **අනුමත කළ දිනය**

   2016 ආගෝස්තු 26 දින

6. **යෝජිත සමාලෝචන දිනය**

   2018 අගෝස්තු

7. **හැදින්වීම**

   මෙම ප්‍රතිපත්ත්මය ලියවිල්ල සඳහා 'ළමයෙකු' යනුවෙන් හැඳින්වනුයේ අවුරුදු 18ට අඩු තරුණ පුද්ගලයෙකු වේ. (1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂණ අධිකාරි පණත)

- **'ළමයින්'** යන වදන/යෙදුම ජාතික තරුණ සේවා සභාවේ (NYSC) යෞවන තිළිණ අංශය මෙහෙයවන එම අංශය තුල හා තිළිණ ඒකක හෝ වෙනත් කිසියම් ස්ථානයක ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධවන අවුරුදු 18ට අඩු ළමා හා තරුණ තැනැත්තන් හැදින්වීමට යොදනු ලැබේ.

- **“කාර්ය මණ්ඩලය”** යන යෙදුමෙන් ජාතික තරුණ සේවා සභාවේ (NYSC) යෞවන තිළිණ අංශයේ සේවා ගිවිසුම මඟින් සේවයේ යොදවා ඇති කාර්ය මණ්ඩලය හැඳින්වෙන අතර, ස්වේච්ඡා හා ගෙවීම් නොලබන පදනම මත කටයුතු කරණ සැමද හැඳින්වේ.
- **‘ප්‍රතිපත්තිය’** යන යෙදුමෙන් හැඳින්වනුයේ ජාතික තරුණ සේවා සභාවේ, යෞවන තිළිණ ප්‍රදාන අංශයේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය වේ.
- ළමයින් සම්බන්ධවන ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී හෝ පැවැත්වීමේදී මඟපෙන්වීම් භාවිතා කරමින් මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීම හා ක්‍රියාවේ යෙදවීම අපේක්ෂිතය.
- ළමයින් සම්බන්ධවන ක්‍රියා කාරකම් හා ඉසව් සඳහා අවම වශයෙන් කාර්ය මණ්ඩලයේ එක් සාමාජිකයෙකු විසින් අදාල වන අවස්ථාවේදී අනිකුත් කාර්ය මණ්ඩලය, ළමයින්, ගුරුවරුන්, හා ශාරීරික ආබාධ සහිත, මානසික සෞඛ්‍ය ගැටළු සහිත, විශේෂ අවශ්‍යතාවයන් සහිත හෝ සුවිශේෂී තත්වයන් යටතේ පසුවන දරුවන්ගේ සහායකයින්ට මෙම ප්‍රතිපත්තිය හා මඟ පෙන්වීම පිළිබඳව මෙහෙයවීම හා දැනුවත් කිරීම සිදුකළ යුතුය.
- ළමයින් සමඟ තනිව සම්බන්ධවීමට හෝ කටයුතු කිරීමට සිදුවන කාර්ය මණ්ඩලයට (ඔහුට හෝ ඇයට) ළමා ආරක්ෂණ පිළිබඳව නිසි පරිදි පුහුණුව ලබා දීම අත්‍යාවශ්‍ය වේ.
- මෙම ප්‍රතිපත්තිය මෙහෙයවන කාර්ය මණ්ඩල සාමාජිකයා / සාමාජිකාව වනුයේ ජාතික අධ්‍යක්ෂ හෝ ව්‍යාපෘති සම්බන්ධිකරණ නිලධාරි හෝ ඔහු හෝ ඇය නොමැති අවස්ථාවලදී යෞවන තිළිණ ප්‍රදාන අංශයේ පරිපාලන කළමණාකරු/ සහකාර අධ්‍යක්ෂකය.
- ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයේ/ වැඩසටහනේ සියළුම ඒකක මෙම ප්‍රතිපත්තියට සමාන වන වෙනම වෘත්තීය ආචාරධර්ම පුරුදු අනුව කටයුතු කළ යුතුය.

## 8. <u>ළමා අයිතිවාසිකම්</u>

- සියළුම ළමයින්ට සුවිශේෂ වූ අවශ්‍යතා හා අයිතිවාසිකම් තිබේ
- ශාරීරික රැකවරණය හා අවධානය ලබා ගැනීම.
- බුද්ධිමය උද්දීපනය ඇතිකරලීමේ අවශ්‍යතාවය.
- හැඟීම් බර ආදරය හා ආරක්ෂාවේ අවශ්‍යතාවය
- සමාජීය සබඳතාවයන් හා සම්බන්ධ තාවයන් පිළිබඳ අවශ්‍ය තාවය.
- සිය අවශ්‍යතා සපුරා ගැනීමේ හා ආරක්ෂා කිරීමේ අයිතිය.
- නොසලකා හැරීමෙන් අපචාරයෙන් හා අවභාවිතයෙන් ආරක්ෂා කිරීමේ අයිතිය.
- වෙනස් හා අසාධාරණ ලෙස සැලකීමෙන් ආරක්ෂා වීම.
- තනි පුද්ගලයෙකු ලෙස සලකනු ලැබීමට ඇති අයිතිය.
- ගෞරවාන්විතව සලකනු ලැබීමට ඇති අයිතිය.

9. **<u>ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය - ළමා ආරක්ෂන ප්‍රතිපත්තිය</u>**

ළමයින් සම්බන්ධයෙන් ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය පහත සඳහන් කරුණු තහවුරු වන බවට සහතික කළ යුතුය.

- ළමයින්ගේ සුබසාධනය පරම බව
- වයස, ස්ත්‍රී, පුරුෂ බව, සංස්කෘතිය, භාෂාව, ජාතිය, ආබාධිතබව (ඇතොත්) ආගම, හෝ ලිංගික අනන්‍යතාවය නොසලකමින් කිසියම් ආකාරයකින් අපචාරයට ලක් කිරීමෙන් හෝ හිරිහැර කිරීමෙන් ආරක්ෂා කිරීමේ අයිතිය.
- අපචාර/ අවභාවිතය පිළිබඳව සියළුම පැමිණිලි, චෝදනා හා සැක කිරීම් සම්බන්ධයෙන් බරපතල ලෙස සැලකීම හා ඒ පිළිබඳව පියවර කෂණිකව හා නිසිපරිදි ඇරඹීම හා කටයුතු කිරීම.
- ළමා ආරක්ෂණය පිළිබඳව ප්‍රධාන සමාජිකයාට හෝ කාර්ය මණ්ඩල සමාජිකයෙකුට පැමිණිළි කිරීමේ / දැනගැනීමට ලක් කිරීමේ වගකීම සියළුම කාර්යමණ්ඩලයට ඇත.

10. **<u>ප්‍රතිපත්ති ප්‍රකාශය</u>**

- ජාතික තරුණ සේවා සභාවේ යෞවන තිළිණ අංශය හෝ එයට සම්බන්ධව ඒකකවලින් හා නියෝජිතයින් මෙහෙය වන ක්‍රියාකාරකම් හා ඉසව්හිදී ඊට සහභාගී වන සියළුම දරුවන් හිංසනයෙන් හා හිරිහැර බාධාකිරීම් වලින් ආරකෂිතවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ වගකීම් හා සාධාරණත්ත්වය තහවුරු කිරීම නිසි පරිදි ව්‍යස්ථාපිත ආයතනයක කාර්ය මණ්ඩලය ලෙස ජාතික තරුණ සේවා සභාවේ, ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයේ කාර්ය මණ්ඩලයට වෘත්තීමය වගකීමක් ඇත. සියළුම දරුවන්ගේ, විශේෂයෙන්ම පහසුවෙන් අනතුරකට ලක්විය හැකි ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ආරක්ෂාව සඳහා අයිතිය ඔවුන් සතුය.

11. **<u>ප්‍රතිපත්තියේ අරමුණු</u>**

- ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයේ මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වනුයේ යහපත් හා හොඳ පුරුදු ප්‍රවර්ධනය කිරිමයි.
- එම අංශය, තිළිණ ඒකක හා එම අංශයේ නියෝජිතයින් මෙහෙයවන ක්‍රියාකාරකම් හා ඉසව්වලට සහභාගිවන කාලය තුලදී දරුවන් හා තරුණ පුද්ගලයින්ට නිසි හා ප්‍රමාණවත් රැකවරණය හා ආරක්ෂාව සැලසීම.
- ළමා ආරක්ෂණය පිළිබඳව සුවිශේෂි කරුණු වලදී දැනුවත් හා පිළිගත හැකි ප්‍රතිචාර දැක්වීමට අවකාශය සැලසීම.

## 12. <u>ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම</u>

- ජාතික තරුණ සේවා සභාවේ,යෞවන තිළිණ ප්‍රදාන අංශයේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය මෙම ලියවිල්ලේ අඩංගුවන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුගමනය කරමින් නිසිපරිදි හා නිවැරදිව ක්‍රියාත්මක කරණු ලැබේ. ළමයින් හා තරුණ පුද්ගයින් සමග කටයුතු කරණ සියළුම කාර්ය මණ්ඩල සාමාජික සමාජිකාවන් යෞවන තිළිණ ප්‍රදාන අංශයේ ආචාරධර්ම පද්ධතිය පුරුදු හා සමඟ බැදුණු මෙම ප්‍රතිපත්තිය අනුව අනිවාර්ය ලෙසම කටයුතු ද කල යුතු අතර, එසේ ක්‍රියා කිරීමට අපොහොසත්වීමේදී මෙම අංශයේ විනය පටිපාටිය අනුව ඔවුන්ට එරෙහිව විනය පියවර ගනු ලැබේ. මේ සම්බන්ධව මාර්ගෝපදේශනය ප්‍රධාන පරාස තුනක් ආවරණය කෙරේ.
- කාර්ය මණ්ඩල බඳවා ගැනීම, සහාය හා පුහුණුව
- කාර්ය මණ්ඩලයේ හැසිරීම.
- ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති නියෝග / නියාමනයන්

## 13. <u>කාර්ය මණ්ඩල බඳවා ගැනීම, සහාය හා පුහුණුව</u>

ළමයින් හා තරුණ පුද්ගලයින් සමඟ කටයුතු කරණු ලබන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී ජාතික යෞවන තිළිණ අංශයේ ආරක්ෂිත බඳවාගැනීම තහවුරු කරමින් ඔවුන් ළමයින් හා තරුණ පුද්ගලයින් සමග කටයුතු කිරීමට සුදුසු බව පරීක්ෂා කල යුතුය. (දැනට සේවය කරන කාර්ය මණ්ඩලයද මෙයට අයත්වේ).

- මූලික වශයෙන් යෞවන තිළිණ අංශයට බඳවා ගැනීම පිණිස අයදුම්පතක් සම්පූර්ණ කල යුතු අතර එමඟින් අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ පෙරකල පිළිබඳ තොරතුරු සැපයේ.
- පහත සඳහන් කටයුතුද ඇතුළුව ක්‍රියාකාරකම් පිළිබඳ පූර්ව පුහුණුවක් (ආයතනයේ වගකීමක්)
    - ක්‍රියාකාරී ඉසව් පිළිබඳව අවශ්‍යතා හා වගකීම්/ පැහැදිලි කිරීම.
    - කාර්ය මණ්ඩල ආචාර ධර්ම පද්ධතිය/ පුරුදු හා ළමා ආරක්ෂන ප්‍රතිපත්තියට අත්සන් කිරීම.
- ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවයන්ට, වගකීම්වලට අනුව කටයුතු කිරීමට හැකියාව මෙන්ම ළමයින් සමග ආරක්ෂිතව ක්‍රියා කිරීමට හැකි බැව් පෙන්නුම් කරණ කාර්ය මණ්ඩලයක් තෝරාගැනීම (ඔවුන්ගේ) අයදුම්පත් වල සඳහන් වන පරිදී පූර්ව ක්‍රියාකාරකම් පුහුණුවේදී තහවුරු කර ඇති පරිදී)
- ළමා ආරක්ෂාව පිළිබඳව කාර්ය මණ්ඩලය සුවිශේෂ වගකීමක් දරන අවස්ථාවලදී (ගුරුවරුන්, දෙමව්පියන් හා ආබාධිත අයගේ ආධාර කරුවන් නොමැතිව කාර්ය මණ්ඩලය සුවිශේෂ වගකීමක් දරන අවස්ථාවලදී) ඔවුන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා පරීක්ෂාව හෝ පොලිස් වාර්තා ලබා ගතයුතුය.

අදාල සියළු කාර්යමණ්ඩලයට මෙම ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියේ පිටපතක් ජාතික අධ්‍යක්ෂ/ පරිපාලන කළමණාකරු වසින් ලබා දෙනු ලැබේ. ළමා ආරක්ෂණ කරුණු/ ගැටළු පිළිබඳව අවධානය යොමුකරමින් දැනුවත් කිරීම නිතිපතා පුහුණුව මගින් සිදුකරනු ඇත.

## 14. කාර්ය මණ්ඩල හැසිරීම

වැරදි හැසිරීම් පිළිබඳ චෝදනාවලින් ආරක්ෂ වීම පිණිස සියළුම කාර්ය මණ්ඩලය ප්‍රශංසනීය හැසිරීමක් පිළිබිඹු කළයුතුය. ඔවුන් සිය හැසිරීම ආදර්ශමත් චරිත බවට පත්වන මට්ටමක පවත්වා ගත යුතු වේ.

## 15. යහපත් පුරුදු (හොඳ පුරුදු) යනුවෙන් හැඳින්වනුයේ

- හැමවිටම පෞද්ගලික හෝ නිරීක්ෂණය නොවන අවස්ථා මග හරිමින් රහස්‍ය බව නොමැති විවෘත පරිසරයක සියළු සන්නිවේදන කටයුතු සිදු කරන්න. කිසිවිටෙක ළමයෙකුට ඔබ සමඟ තනිවීමට ඉඩ නොතබන්න. සමහර අවස්ථාවලදී රහස්‍ය සම්මුඛ සාකච්ඡාවක් හෝ හමුවක් පැවැත්වීමට සිදුවන විටෙකදී එය විවෘත දොරක් සහිත කාමරයක හෝ පිටතට පෙනෙන කාමරයක සිට සිදු කළ යුතුය. එසේ කිරීමට අපහසු අවස්ථාවකදී තවත් වැඩිහිටියෙකු ඒ අසල සිටිනා බවට තහවුරු විය යුතුය. ළමයින් සමග ශාරීරික ස්පර්ශ කිරීම් මග හැරීමට ක්‍රියා කල යුතුය. (සමහර අවස්ථාවලදී විපතටපත් ළමයා ශාරීරික ස්පර්ශන මඟින් අස්වැසීමට (සැනසීමට) ක්‍රියා කළ යුතුවන අතර, එවන් විටදී එය උචිත ලෙස කිරීමට හා ආසාධාරණ ලෙස සිදු නොකිරීමට කාර්ය මණ්ඩලය සිය අභිමතය භාවිතා කළ යුතුය). තරඟ වලදී හැකිපමණ ශාරීරික ස්පර්ශ මඟ හැරීමට ප්‍රවේශම් විය යුතුය. ශාරීරික ස්පර්ශ කිරීම් නොවැලැක්විය හැකි අවස්ථාවලදී (උදා - උපකරණයක් භාවිතය පෙන්නුම් කිරීමේදී හෝ සුවිශේෂ ව්‍යායාමයක් සිදු කිරීමේදී) එම ස්පර්ශ කිරීම සිදු විය යුතු සීමාව හා එයට වැරදී අර්ථකථනයක් දීමට හැකි ඉඩ ප්‍රස්ථාව පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් විය යුතුය.
- සියළුම ළමයින්ට/දරුවන්ට එකසේ සමානව සැලකීමක් හා ගෞරවයක් සහිතව සැලකීමක් කළ යුතුය. කිසියම් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට වෙනස් ලෙස සැලකීම මඟහැරවීමට අවශ්‍ය සියළු ධනාත්මක පියවර ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය ගනු ලබනු ඇත. ළමයින්ගේ හැකියාව ඇතුළු කිසියම් පදනමක් මත වෙනස්ලෙස සැලකීමේ (Discrimination) එවැනි ප්‍රකාශ කිරීම් හා හැසිරීම් වලින් ඔවුන් අරක්ෂා කිරීමට කාර්ය මණ්ඩලය සහතික විය යුතුය. සියළුම ළමයින් ඇතුලත් වන පරිදි හා වෙනස්වීම් පිළිබඳ ආකල්ප ප්‍රවර්ධනය වන පරිදී ක්‍රියාකාරකම් සැකසීය යුතුය.
- කිසියම් ක්‍රියාකාරී කමක් ඇරඹීමට පෙර එහි අරමුණු පිළිබඳව පැහැදිළි කරගත යුතු වන අතර ජයග්‍රහණය හෝ අරමුණු සාක්ෂාත්කර ගැනීමට(ළඟාකර ගැනීමට) පෙර හැමවිටම ළමයින්ගේ සුභ සිද්ධියට මුල්තැන දිය යුතුවේ.

- කිසිවිටෙක ව්‍යාපෘති සම්බන්ධිකරණ නිළධාරී හෝ අනිකුත් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දී ඇති උපදේස් වලට පටහැනි උපදෙස් නොදිය යුතුය.
- ළමයින් සමඟ ආරක්ෂිත හා උචිත පරතරයක් පවත්වාගත යුතුය. (උදා - ළමයෙකු සමඟ ඉතා කුළුපග සමීප සබඳතාවක් පැවැත්වීම හෝ නේවාසික ක්‍රියාකාරකම්/ඉසව් වලදී ළමයෙකු සමඟ එකම කාමරයක නතරවී සිටීම කාර්යය මණ්ඩලයට උචිත නොවේ).
- තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වීමට ළමයින් සවිබල ගන්වන සංතුලිත සබඳතාවයක් ළමයින් සමඟ ගොඩනගා ගැනීම.
- පිරිමි හා ගැහැණු ළමුන් මිශ්‍ර කණ්ඩායම් අධික්ෂණය කිරීමේදී ඔවුන් සමඟ පිරිමි හා ගැහැණු කාර්ය මණ්ඩලය සිටිය යුතු බවට සහතික විය යුතුය. ඒසේම එකම ලිංගිකත්වයේ අය අතරද අපචාරයන් සිදු විය හැකි බැව් සිහියේ තබා ගත යුතුය.
- නේවාසික ඉසව් වලදී වැඩිහිටියන් ඉතාම අත්‍යවශ්‍ය විටකදී හැර ළමයින්ගේ කුටි/කාමරවලට ඇතුළු නොවීමට සහතික විය යුතුය. (උදා - අසනීප විටෙකදී, මෙහිදී මීට ඉහත දක්වා ඇති පෞද්ගලික සම්මුඛ සාකච්ජා හා සාකච්ජා වලට අදාල ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය) කාර්යය මණ්ඩලය කිසිවිටෙක ළමයින්ට සිය කුටිවලට ආරාධනා නොකළ යුතුය. විශිෂ්ඨ ආදර්ශමත් චරිත ලෙස දරුවන්ට/ළමයින්ට ආදර්ශමත් වන ලෙස හැසිරිය යුතුය. ළමයින් සම්බන්ධව වගකීම් දරණ කිසිවිටකදී දුම්පානය හෝ මත්ද්‍රව්‍ය පාවිච්චි නොකළ යුතුය.
- සෘණාත්මක/ අශුභවාදී විවේචන වෙනුවට ධනාත්මක, උද්යෝගාත්මක හා අර්ථකාරී/අර්ථවත් පසු විපරම් කළ යුතුය.
- ළමයෙකු හෝ තවත් පුද්ගලයෙකු හෝ දේපල ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය විටකදී හැර අන් කිසිවිටක ළමයෙකුට එරෙහිව ශාරීරික බලයක් නොයෙදිය යුතුවේ. එවන් අවස්ථාවකදී අවම බලයක් අවම කාලයක් තුල භාවිතා කළ යුතුය.
- කිසිවිටෙක ශාරීරික ප්‍රතිකාර නොකළ යුතුය.
- වයස අවුරුදු 16ට වඩා අඩු වියැති දරුවකුට ප්‍රථමාධාර හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට අවශ්‍ය අවස්ථාවලදී දෙමාපිය ලිඛිත කැමැත්ත ලබා ගැනීම මැනවි. එසේ ලබා දී ඇති ප්‍රථමාධාර පිළිබඳව ලිඛිතව සටහන් කොට දෙමාපියන්ට හෝ ආබාධිත දරුවකුගේ නම් ඔහු හෝ ඇය බලාගන්නා අයට දැන්වීම පිණිස කාර්ය මණ්ඩලයේ ජේෂ්ඨයෙකුට දැන්විය යුතුය. එසේ තුවාලයක් හෝ අනතුරක් සිදු වු බැව් සහ ඒ පිළිබඳව ලබා දුන් ප්‍රතිකාර පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන් ලිඛිත වාර්තා තබා ගත යුතුවේ.
- එවැනි දරුවකු/ළමයෙකු කාර්ය මණ්ඩලයේ පෞද්ගලික වාහනයකින් ප්‍රවාහනය කිරීමට සිදුවුවහොත් දෙමාපියන්ගේ ලිඛිත අවසරය ඉල්ලා සිටීම මැනවි.
- ළමයෙකු/දරුවකු සම්බන්ධවන කිසියම් ප්‍රශ්ණයක් හෝ ගැටළුවකදී එය ළමා ආරක්ෂණය පිළිබඳ වගකීම දරණ ප්‍රධාන සාමාජිකයාට යොමුකළ යුතුය.

- ක්‍රියාකාරකම් පැවැත්වෙන ස්ථානයට ඇතුළුවන හා ළමයින් සමඟ සම්බන්ධ වීමට උත්සාහ කරණ නොහඳුරණ වැඩිහිටියන්ගෙන් ප්‍රශ්ණ කළ යුතුය.

16. <u>අවසර ලබා නොදිය යුතු පුරුදු</u>

- රළු ශාරීරික ක්‍රීඩා හෝ ලිංගික හැගීම් ඇතිකරන/උද්දීපනය කරන ක්‍රීඩාවල යෙදීම.
- ළමයෙකු සමඟ එකම කාමරයක් පාවිච්චි කිරීම.
- ළමයෙකුගේ කිසියම් අනුචිත වචන භාවිතය හෝ හැසිරීම. එවැන්නක් අභියෝගයට ලක් යුතුවේ.
- කවටකමට හෝ ළමයෙකුට ලිංගික අරමුණු දනවන ප්‍රකාශ කිරීම.
- පාලනය කරගැනීමේ මාධ්‍යයක් ලෙස ළමයෙකු හැඬවීම.
- ළමයෙකු විසින් කරනු ලබන චෝදනාවක් හෝ පැමිණිල්ලක් ලේඛණ ගත නොකිරීම හෝ ඒ පිළිබඳව පියවර නොගැනීම.
- ළමයින්ට පෞද්ගලික වන හා ඔවුන්ටම ඉටු කර ගත හැකි කාර්යයන් සිදු කිරීම
- ළමයෙකුට තම (කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ) නිවසේ නතරවීමට හෝ රාජකාරී ස්ථානයෙන් බැහැර ස්ථානයකදී හමුවීමට ආරාධනා කිරීම හෝ ඊට ඉඩ සැලසීම.

17. <u>ඡායාරූප හෝ සිනමාකරණ උපකරණ භාවිතය</u>

ඡායාරූප ගත කිරීමට හෝ විඩීයෝ ගත කිරීමට පූර්ව දෙමාපියන්ගේ කැමැත්ත ලබා ගත යුතුය. එයට අනුමැතිය ලබා දීම පිණිස එම ඡායාරූප හෝ ප්‍රතිරූප යොදා ගන්නා අයුරු පිළිබඳව දෙමාපියන් දැනුවත් කළ යුතුය. මෙම ඡායාරූපය යොදා ගැනීම සම්බන්ධයෙන් සියළු තොරතුරු(මුද්‍රිත, බහු මාධ්‍ය හා ගුවන් විදුලි ප්‍රචාර) සහ එහි අරමුණ (ප්‍රවර්ධනය, ප්‍රචාරය,ඇගවුම,විගණනය හා සමාලෝචනය) එයට ඇතුලත්වේ. හැකි අවස්ථාවලදී ප්‍රේක්ෂකයින්, (සමාන්‍ය ජනතාව, සහභාගීවන ළමුන්, ඔවුන්ගේ පවුලවල අය, වෙනත් සංවිධාන හා ආයතන) කව්රුන්ද යන්න පිළිබඳව ද දැනගැනීමට සැලැස්වීම මැනවි.

18. <u>ළමා ආරක්ෂන නියෝග/නියාමන</u>

ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය ළමා ආරක්ෂන ප්‍රතිපත්තියේ දී ඇති පහත සඳහන් නියෝග අනුගමනය කරනු ලැබේ.

- ළමා ආරක්ෂනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා උචිත පුහුණුවක් මෙන්ම සහාය ඇති ළමා ආරක්ෂන කටයුතු මෙහෙයවන නියවු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ආයතනය සතුව සිටින බවට සහතිකවීම.
- ළමා ආරක්ෂනය හා ඊට සම්බන්ධ කාර්යභාරය පිළිබඳව වගකිව යුතු නියමු නිළධාරි/සාමාජිකයා කවරෙක්ද යන්න කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම දැනුවත් බවට සහතික වීම.

- අපචාර/අවභාවිත නිමිත්තක් පිළිබඳව අවබෝධයෙන් සිටීමේ වගකීම හා එවැනි සිද්ධි සම්බන්ධවයෙන් නියමු සාමාජිකයාවෙත යොමු කිරීමේ වගකීම සියළුම කාර්යය මණ්ඩල සාමාජිකයින් අවබෝධ කර ගෙන ඇති බැව් තහවුරු කිරීම. කෙසේ වෙතත් තමා එවන් කටයුතුද සම්බන්ධයෙන් පියවර ගැනීමට හෝ එවන් අපචාරයෙන් සිදුවුවාද යන්න පිළිබඳව තීරණය කිරීමට පුහුණුව ලබා නොමැති බැව් කාර්ය මණ්ඩලය සිතේ දරාගත යුතුය.
- ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයේ නිලධාරීන් මත පැවරෙන වගකීම පිළිබඳව වෙබ් අඩවිය හා අනිකුත් එම අංශය මඟින් පළ කරණ ලියවිලි මඟින් දෙමාපියන් අවබෝධ කරගන්නා බවට සහතික වීම.
- ළමා ආරක්ෂණ කටයුතු සම්බන්ධවයෙන් විමසීම් සඳහා අදාල ඒකක හා ආයතන සමඟ කාර්යක්ෂම සබඳතාවයක් ගොඩනගා ගැනීම හා සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම
- යම් කටයුත්තක් සම්බන්ධයෙන් කෂණිකව පියවර ගැනීමට අවශ්‍ය නොවුනද ළමයින් සම්බන්ධව සියළු කටයුතු පිළිබඳව සියළු තොරතුරු වාර්තාගත කිරීමට ක්‍රියා කිරීම.
- සිදුවිය හැකි අපචාරයක්/අවභාවිතයක් පිළිබඳව පටිපාටියක් අනුගමනය කිරීම.

19. **<u>අපචාරය/අවභාවිතය යනු කවරේද?</u>**

පුද්ගලයින් විශේෂයෙන්ම වැඩිහිටියන් දරුවන්/ළමයින්ට හිරිහැර කිරීම පැහැදිළි කිරීමට යොදා ගන්නා යෙදුමකි.

**ළමාඅපචාර** යනු ළමයින් නොසලකා හැරීම, ශාරීරික තුවාල සිදු කිරීම,ලිංගික හෝ මානසික (හැඟීම්) අවභාවිතය/අපචාරය දැන දැනම සිදු කිරීම හා එය මඟ හැරීමට පියවර නොගැනීම සහ එයින් සුවිශේෂ හානියක් හෝ මරණය පවා සිදුවීමය.

20. **<u>සත්‍යවු/හෝ සිදුවිය හැකි අපචාර/අවභාවිතය පිළිබඳ දැනුවත්වීම</u>**

අපචාරයක්/අවභාවිතයක්/විද්‍යාමාන වන විවිධ ක්‍රම තිබේ.

- දරුවා/ළමයා අපචාරය/අවභාවිතය හෙළි කිරීම.
- දරුවා/ළමයා තමා අපචාරයට/අවභාවිතයට ලක් වු බැව්,දැන්වු බව හෝ තමා එසේ සිදුවු බැව්, හෝ සිදුවන බැව් තදින්ම විශ්වාස කරණ බැව් වෙනත් කෙනෙකු හෙළිකිරීම.
- ශාරීරික තුවාල සිදු කිරීමක් ළමයා පෙන්නුම් කිරීම හා එයට සතුටු දායක පැහැදිළි කිරීමක් නොමැතිවීම.
- තමා අපචාරයට/අවභාවිතයට ලක් වු බැව් ළමයාගේ හැසිරීමෙන් පෙන්නුම් කරණ අවස්ථා.
- කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ හැසිරීම හෝ ළමයෙකු සම්බන්ධයෙන් ඔහු/ඇය කරණ පැහැදීළි කිරීම් අවධානයට ලක්වීම.(සැක සහිතවීම)

21. **<u>හෙළිකිරීම් පිළිබඳ ගැටළු</u>**

අපචාර/අවභාවිතය පිළිබඳව දැනුවත් වීම ඒ ඒ පුද්ගලයාට පෞද්ගලිකවන උද්වේගී ප්‍රතික්‍රියා රාශියක් ඇතිවිය හැක. ප්‍රතික්‍රියාව කුමක් වුවත් අපචාරය සත්‍ය වූ හෝ සැකකරණ බවට කෙසේ විද්‍යාමාන වුවත්, මෙහි දක්වා ඇති නියෝග ප්‍රකාරව එයට නිවැරදි ලෙස ප්‍රතිචාර දැක්විය යුතුවේ. අදාල හෙළිකිරීමේ සත්‍යතාවය අඩමාන වුවත්, ඊට නියමිත (සුදුසු) ප්‍රතිචාරයක් දැක්විය යුතුවේ. මෙහි දැක්වෙන නියෝග අනුව ප්‍රතිචාර දැක්වීමට නියම කාර්ය මණ්ඩල සාමාජිකයා සහ අවසාන වශයෙන් ජාතික යෞවන තිලිණ ප්‍රදාන අංශයද සහාය දක්වනු ඇත.

22. **<u>සැක කටයුතු හෝ හෙළිකිරීමකදී ගතයුතු පියවර</u>**

සැක කිරීම්, චෝදනා හා හෙළිකිරීම් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී සමහර මුල ධර්ම අනුගමනය කෙරේ.

23. **<u>කලයුතු හා නොකල යුතු දේ</u>**

- සන්සුන් වන්න.
- කලබල වී බිය නොවන්න.
- අධි ප්‍රතිචාර නොදැක්විය යුතුය.
- සහභාගිවන්නා (ළමයා) ආසන්න අනතුරකයට ලක්වීම අතිශයින්ම විරලය/නොවිය හැකිය.
- ඇහුම්කන් දෙන්න, අසා සිට විශ්වාස කරන්න.
- වැඩි තොරතුරු සඳහා පරීක්ෂණ නොකරන්න.
- සහභාගී වන්නාගෙන් (අනතුරට ලක් වූ අය) විමසීමෙන් එම හෙළිකිරීම භාර ගැනීම සම්බන්ධව පසුව බලපෑමක් ඇතිවේ.
- තමාට අවශ්‍ය දේ පැවසීමට පුද්ගලයින්ට කාලය ලබා දෙන්න.
- උපකල්පනය නොකරන්න, භාවාර්ථ ප්‍රකාශ නොකරන්න, විකල්ප පැහැදිලි කිරීම් ඉදිරිපත් නොකරන්න.
- සිද්ධිය පිළිබඳව පැවසීමෙන් ඔවුන් නිවැරදි දෙය කළ බැව් යළි තහවුරු කර පැහැදිළි කරන්න.
- මේ පිළිබඳව දැනගත යුතු වෘත්තිකයන්ට පමනක් දන්වන බැව් පැහැදිළි කරන්න.
- රහස්‍ය කරණු සම්බන්ධයෙන් රහස්‍යතාවය රැකීමට පොරොන්දු නොවන්න. එසේම, සියල්ල දැන් හරි බැව් නොපවසන්න.(එය එසේ නොවිය හැක).
- මෙම ප්‍රතිපත්තියේ නියෝග/නියාමයන් ප්‍රකාර කෂණිකවම පියවර ගන්න.
- ඔබම ඒ සඳහා කටයුතුද කිරීමට උත්සහ නොකරන්න.
- පවසන ලද දෙය හැකි පමණ එම වචන වලින්ම සටහන් කර ගැනීමට හැකි පමණ කටයුතු කරන්න.
- චූදිත අපයෝජකයා පිළිබඳව සෘනාත්මක ප්‍රකාශ නොකරන්න.

- නියමු කාර්ය මණ්ඩල සාමාජිකයාට රපෝර්තු කරන්න.
- ඔබට පැවසූ දෙය පිළිබඳව සගයන් සමඟ ඔපාදූප කථා කිරීමෙන් වලකින්න.
- ඔබගේ වාර්තාව සටහන් කරන්න.
- අනවශ්‍ය ලෙස ළමයාට/දරුවාට සිද්ධිය ගැන නැවත නැවත පැවසීමට ඉඩ නොතබන්න.
- අපචාරය සම්බන්ධයෙන් හෙළිකිරීම/රපෝර්තු කිරීම ළමයින් සමඟ කටයුතු කරණ ඕනෑම නෙනෙකුගේ රාජකාරිය වේ.
- සැක කිරීම හෝ චෝදනාව සත්‍යද යන්න තීරණය කිරීම කාර්ය මණ්ඩලයට අයත් නොවේ. සියළුම සැක කිරීම් හා චෝදනා බරපතල ලෙස සළකා නියෝග/නියාමනයක් අනුව කටයුතුද කළ යුතුය.

## 24. <u>වගකීම</u>

- සැක කිරීම්, චෝදනා හෝ සත්‍ය අපචාර පිළිබඳව නිසි/ උචිත පියවර ගැනීම කාර්ය මණ්ඩලයේ වගකීම බවට ඔවුන් දැනුවත් විය යුතුය.
- සැක කිරීමක් පිළිබඳව කළ යුතු හා නොකළ යුතු කරුණු වලට අනුකූලව රපෝර්තු කිරීම හා එම දැන්වීම බරපතල ලෙස සලකන බැව් තහවුරු කිරීම මුලින්ම සැකකළ හෝ දැනගත් තැනැත්තාගේ වගකීම් වේ.
- එවැනි සිද්ධියක් දැනගත්විට වහාම නියමු කාර්ය මණ්ඩල සාමාජිකයාට රපෝර්තු කළ යුතු අතර අපචාරය පිළිබද සැකකිරීම හෝ චෝදනාව සම්බන්ධයෙන් පියවර ගැනීම ඔහුගේ වගකීමක් වේ.

## 25. <u>ව්‍යවස්ථාපිත ළමා ආරක්ෂණ පටිපාටිය</u>

- මීළඟට සිදුවිය යුතු දෙය පිළිබඳව තීරණය සහමුලින්ම තීරණය කෙරනුයේ අදාල ව්‍යවස්ථාපිත ආයතනයයි. (උදා - පරිවාස හා ළමා කටයුතු දෙපාර්තමේන්තුව හා සමාජ සේවා දෙපාර්තමේන්තුව) ප්‍රමාණවත් තොරතුරු ඉහත ආයතන වෙත යොමු කළ විට එම සැක කිරීම, චෝදනාව හෝ සත්‍ය සිදුවීම පිළිබඳව නීති ප්‍රකාරව ක්ෂණික පියවර ගැනීමට හෝ අනිකුත් ආයතන (නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන) කිහිපයක් හරහා පරික්ෂා කිරීම හෝ බොහෝවිට ළමා ආරක්ෂණ සම්මේලනයක් පැවැත්වීම සිදු කෙරේ.

## 26. <u>සැකකිරීම් හෝ සත්‍ය සිදුවීම් ලේඛනගත කිරීම</u>

ව්‍යවස්ථාපිත ආයතන හරහා සිදුවනදේ නොසලකමින් සියළු තොරතුරු ලේඛණගත කළ යුතුය.

## 27. <u>සිද්ධියක් වාර්තා කිරීමේදී පහත දැක්වෙන තොරතුරු ඉතා වැදගත්වේ</u>

- සැක කිරීම, චෝදනා හෝ සත්‍ය සිදුවීම හෙළිවූ වේලාව හා දිනය
- ඉහත සිද්ධිය සම්බන්ධව ඔබට ලබාදුන් තොරතුරු

- අදාල පාර්ශව පිළිබඳව ඉඟියක්
- ඔබ හා ආයතනය ගෙන ඇති පියවර පිළිබඳ විස්තර
- සිද්ධිය පිළිබඳ රපෝත්තු කළ අය (ආයතනය) හා කවදාද යන වග.

කිසියම් හේතුවක් නිසා සිද්ධිය පිළිබඳව අදාල ව්‍යවස්ථාපිත ආයතනයකට වාර්තා නොකළ අවස්ථාවලදී, එසේ වාර්තා නොකිරීම පිළිබඳව පූර්ණ පැහැදිළිකිරීමක් ලේඛණ ගත කළ යුතුය.

වාර්තාගත කිරීම සිද්ධිමය විය යුතු අතර ඔබගේ පෞද්ගලික මතය සඳහන් නොවිය යුතුය.

වාර්තා පූර්ණ රහස්‍යතාවය මත ආරක්ෂිතව (අගුළු දමා) තබා ගත යුතු අතර, සැකකිරීම, චෝදනාව හෝ සත්‍ය සිදුවීම පිළිබඳ තොරතුරු දැන ගත යුතු අය සමඟ පමණක් තොරතුරු බෙදාගත යුතුය.

ජාතික තරුණ සේවා සභාවේ යෞවන තිළිණ ප්‍රදාන අංශයේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය හා එක්ව සම්බන්ධවන සමාන ලෙස හා විවිධ ලෙස සැලකීමේ ප්‍රතිපත්තියක් (Equality and Diversity Policy) ශාරීරික හා මානසික ආබාධ සහිත අය ඇතුළු සියළු ළමයින් සමඟ කටයුතු කිරීමේදි අනුගමනය කෙරේ.

මෙම ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.08.26 දින අනුමත කරන ලදී.